**ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතිය - 2020**

-----------------------------------------------------------------------------------------------------------

ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා **Agence Francaise De Development** අතර 2015 ඔක්තෝබර් 02 දින එලඹි අංක සීඑල්කේ 101104 එල් දරන ණය පහසුකම් ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දින එලඹි අංක සීඑල්කේ 101104 එල් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම් අනුව, බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්තිය ජාලක අවශෝෂණ ධාරිතාව ඉහල නැංවීම සහ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ දායකත්වය මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල කිලෝ වොට් 132/33 ක උපපොළවල් ඉදිකිරීම යන සංරචක 4 ක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,660.10කට සමාන යූරෝ මිලියන 41.4ක් වන අතර ඉන් රු. මිලියන 4,865.90 කට සමාන යූරෝ මිලියන 30ක් මූල්‍යයනය කිරීමට Agence Francaise De Development එකඟ වී තිබුණු අතර උපකරණ සහ වැඩ සැපයීම් කොන්ත්‍රාත්තුවේ කොටසක් මූල්‍යනය කිරීමට භාවිත කරනු ලැබේ. ඉතිරි මුදල වන රු.මිලියන 1,794.20කට සමාන යූරෝ මිලියන 11.1ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කරන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නො කරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ----------- | ----- රු. | ----------------- | ----------- |
| (අ) | ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද රු.71,855,666ක් වටිනා මෝටර් රථ 5ක් පසුව ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත්, එම වාහන ව්‍යාපෘති කටයුතු සම්බන්ධයෙන් භාවිත කර තිබුණද එම වාහනවල වටිනාකම ජංගම නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි. | 71,855,666 | ලංකා විදුලිබල මණ්ඩලයේ නමට වත්කම්වල අයිතිය මාරු කරන තෙක් වත්කම් කෙරීගෙන යන වැඩ ගිණුමේ තැබීම ව්‍යාපෘති අංශයේ වර්තමාන භාවිතය වේ. ලංකා විදුලිබල මණ්ඩලයේ නම ඇති සියලුම වත්කම්, වත්කම් පිළිබඳ මධ්‍යගත කළ දත්ත සමුදායක් පවත්වා ගැනීමේ අරමුණින් අතිරේක සාමාන්‍ය කළමණාකරුගේ ව්‍යාපෘතිය පිරිවැය මධ්‍යස්ථානය - වෙත මාරු කරනු ලැබේ. | ව්‍යාපෘතිය සඳහා මිලදීගත් වත්කම් ව්‍යාපෘතියේ වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද මෝටර් වාහන 8ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ වෙනවම පෙන්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම වටිනාකමින් කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | - | ලංකා විදුලිබල මණ්ඩලයේ නමට වත්කම්වල අයිතිය මාරු කරන තෙක් වත්කම් කෙරීගෙන යන වැඩ ගිණුමේ තැබීම ව්‍යාපෘති අංශයේ වර්තමාන භාවිතය වේ. ලංකා විදුලිබල මණ්ඩලයේ නම ඇති සියලුම වත්කම්, වත්කම් පිළිබඳ මධ්‍යගත කළ දත්ත සමුදායක් පවත්වා ගැනීමේ අරමුණින් අතිරේක සාමාන්‍ය කළමණාකරුගේ ව්‍යාපෘතිය පිරිවැය මධ්‍යස්ථානය - වෙත මාරු කරනු ලැබේ. | ව්‍යාපෘතිය සඳහා මිලදීගත් වත්කම් ව්‍යාපෘතියේ වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඇ) | ශුද්ධ විනිමය ලාභය රු. 79,442,841ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ | 79,442,841 | සටහන් කර ගන්නා ලද අතර නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදය භාවිත කළ යුතුය. |

දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ වටිනාකමින් අඩුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම වටිනාකමින් කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

**2.2 රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------- | -------------- | ---------------- | ------------ |
| (අ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2020 ජුනි 08 දිනැති එස්ඊසී/ 2020/03(සංශෝධිත) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | ව්‍යාපෘතිය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී අදාළ නිලධාරීන්ගෙ වැටුපෙන් අඩුකිරීමකින් තොරව උපයන විට ගෙවීම් බදු/උසස් පුද්ගලික ආදායම් බදු (APIT) රු.538,202ක් ඔවුන්ගේ අරමුදල්වලින් ගෙවා තිබුණි. | එහි සේවකයන් උපයන විට ගෙවීම් බදු වගකීමට යටත් නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු වගකීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරා ඇත. මේ පිළිබඳව කිහිප වතාවක් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත දැනුවත් කර ඇති අතර වෘතීය සමිති සමග සාකච්ඡාවක් පවත්වන ලදි. කෙසේ වෙතත්, එය නැවත සේවකයින් වෙත ආපසු හැරවීම පිළිබඳ එකගතාවකට එළඹ නොතිබුණි. 2018-04-23 දිනැති අංක 2068/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2018-01-04 දින අත්සන් කරන ලද සම්මුතික ගිවිසුම ප්‍රසිද්ධ කර ඇත. එකගවූ වැටුප් වෙනස්කිරීමට සම්මුතික ගිවිසුම කඩකිරීම ඇති අතර තව දුරටත් නීතිමය බලපැමක් ඇතිකරයි. | මණ්ඩලය විසින් පුද්ගලික බදු නිලධාරීන්ගේ වැටුපෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර | ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශය මගින් | ව්‍යාපෘතියේ කාර්යක්ෂමම බව සහ |

| | | | | |
|---|---|---|---|---|
| | දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | විගණකවරයකු බඳවා ගැනීමට හෝ ව්‍යාපෘතියේ ගනුදෙනු ලං.වි.ම අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්වී නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකර ඇති අතර ඔවුන් ලං.වි.ම නියැදි පදනමින් විගණනයන් සිදු කරනු ලැබේ. | ඵලදායී බව සහතික කිරීමට අභ්‍යන්තර විගණනයක විසින් විගණනය කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 23 දිනැති අංක 2006/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.3 වගන්තිය | ප්‍රතිපාදන වලට පටහැනිව, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු දින දීමනා සහ ප්‍රසාද දීමනා එකතුව රු. 24,813,513ක් 2020 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි. | මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සියළු දෙනාටම අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ වලට අනුව වේ. | රෙගුලාසිවලට අනුකූල වීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| **සංරචකය** | **2020 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදයන් සඳහා හේතු** |
|---|---|---|---|
| | **අපේක්ෂිත කාර්ය සාධනය ප්‍රතිශතය** | **අත්කර ගත් කාර්ය සාධනය ප්‍රතිශතය** | |
| <u>මාලිබොඩ</u> | | | |
| කොටුමා උපපොළ | 100 | 100 | - |
| සම්ප්‍රේෂණ රැහැන් | 100 | 100 | |
| <u>රාගල</u> | | | |
| කොටුමා උපපොළ | 95 | 93 | |
| සම්ප්‍රේෂණ රැහැන් | 95 | 93 | ප්‍රතිචාර දක්වා නොමැත. |
| <u>නාවලපිටිය</u> | | | |
| කොටුමා උපපොළ | 95 | 93 | |
| සම්ප්‍රේෂණ රැහැන් | 95 | 98 | ප්‍රතිචාර දක්වා නොමැත. |
| <u>වේවැල්වත්ත</u> | | | |
| කොටුමා උපපොළ | 100 | 100 | |
| සම්ප්‍රේෂණ රැහැන් | 100 | 100 | - |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** ප්‍රතිචාර දක්වා නොමැත

**විගණකගේ නිර්දේශය** මණ්ඩලයේ සැලසුම් හා සම්බන්ධ වීමට නියමිත කාලයේදී කටයුතු නිම කළ යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති කළමණාකරු සහ ගණකාධිකාරි පිළිවෙළින් 2020 ඔක්තෝබර් සහ 2019 ජනවාරි සිට වැඩ බැලීමේ පදනම මත බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිචාර දක්වා නොමැත | ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පූර්ණ කාලීනව සේවයේ නියුතු වීමට හැකි නිලධාරීන්ගෙන් ප්‍රධාන තනතුරු පිරවිය යුතුය. |

### 3.3 වැඩබිම් පරීක්ෂාවේදී සිදු කරන ලද නිරීක්ෂණ

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති තාක්ෂණිකව 2019 ඔක්තෝබර් 30 දින නිම කළ යුතු වුවද, වර්ෂ 01මාස 03ක ප්‍රමාදයන් සහිතව රාගල කොටුමා උපපොළ 2021 මැයි 20 දින බලශක්තං සහ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණු අතර නාවලපිටිය කොටුමා උපපොළ 2021 පෙබරවාරි 07 දින ආරම්භ කර තිබුණි. | ප්‍රතිචාර දක්වා නොමැත | මණ්ඩලයේ සැලසුම් හා සම්බන්ධ වීමට නියමිත කාලයේදී කටයුතු නිම කළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය අවසන් අදියරේ පැවතියද කොටුමා උපපොළවල් හතර ඉදිකර තිබුණු හෙක්ටෙයාර 6.0032ක පුද්ගලික ඉඩම් අදාළ ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් අත්පත් කරගත යුතු අතර පසුව මණ්ඩලය වෙත දීර්ඝ කාලීනව කල්බදු පදනමට දීමට පියවර ගත යුතුය. | මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය සහ රාගල උපපොළවල් සඳහා තෝරාගත් ඉඩම් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත කල්බදු ක්‍රමයට කරනු ලැබේ. කොටුමා උපපොළවල් ඉදිකිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් ලිඛිත අවසරය ලබා දී ඇත. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසානයේ දී දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලීම් කිරීමෙන් පසු ලං.වි.ම කල්බදු ගෙවනු ලැබේ. | ව්‍යාපෘතිය අවසන් වීමට පෙර වත්කම් කල්බදු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් බිල් යටතේ මිලදීගත් සහ ලංකා විදුලිබල මණ්ඩලය මගින් තීරු ගාස්තු ගෙවන ලද වාහන ලංකා විදුලිබල මණ්ඩලයේ නම යටතේ ලියාපදිංචි කර නොතිබුණි. | ඉංජිනේරුවරුන්ගේ ප්‍රවාහනය සඳහා කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද වාහන ව්‍යාපෘතිය අවසානයේදී ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලියාපදිංචි කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන්ගේ බිල් මගින් මිලදී ගන්නා ලද සහ තීරු ගාස්තු ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද වාහන ලංකා විදුලිබල මණ්ඩලයේ නමට ලියාපදිංචි කළ යුතුය. |